සියලුම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

# තෙවන වාර පරීක්ෂණය 2018

08 ශ්‍රේණිය **ක්‍රිස්තු ධර්මය** කාලය පැය 02 යි

| නම/ විභාග අංකයඃ |
|---|

## I කොටස

- **සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**
- **නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

01. හොඳ නරක අවබෝධ කරගැනීමේ ගසින් සංකේතවත් කරනුයේ,
    (1) දේව කැමැත්ත ය. (2) යහපත ය. (3) පාපය ය. (4) පරිපූර්ණත්ව ය.
02. ඊශ්‍රායෙල් ජනතාව වහලුන් ලෙස සිටියේ කුමන රජු යටතේ ද?
    (1) දාවිත් රජු ය. (2) සාවුල් රජු ය.
    (3) නෙබුකද්නේසර් රජු ය. (4) පාරාවෝ රජු ය.
03. යහපත් බැටලු එඬේරා ලෙස හඳුන්වනු ලබන්නේ,
    (1) දාවිත් ය. (2) ජේසුස් වහන්සේ ය.
    (3) ආබ්‍රහම් ය. (4) ජෝසෙප් ය.
04. අයකැමියෙක් ලෙස හැඳින්වූ ගෝලයා වනුයේ,
    (1) තෝමස් ය. (2) පිලිප් ය. (3) බර්තෙලමෙව් ය. (4) මතෙව් ය.
05. ජේසුස් වහන්සේගේ ප්‍රථම දේශනය සිදුකළේ,
    (1) ගලීලයේ මුහුද ළඟ ය. (2) නාසරෙත් ධර්මශාලාවේදී ය.
    (3) පාළුකරයේදී ය. (4) තැනිතලාවේදී ය.
06. 'යාච්ඤාවේ ගුරුවරිය' ලෙස විරුදාවලිය ලබන්නේ,
    (1) තෙරේසා මව්තුමිය යි. (2) ජොයිස් සිල්වා ය.
    (3) එලිසා ඇග්නිව් ය. (4) ඉව්ලින් කානි තුමිය යි.
07. ශුද්ධාත්ම දීමනා ගැන ශු. බයිබලයේ සඳහන් ග්‍රන්ථය වන්නේ,
    (1) එපීස පොතේ ය. (2) රෝම පොතේ ය.
    (3) I කොරෙන්ති පොතේ ය. (4) ගලාති පොතේ ය.
08. 'ජේසුස් වහන්සේ දෙවියන් වහන්සේගේ ක්‍රිස්තුවරයාණෝය.' ලෙස පැවසුවේ,
    (1) පේදුරු නම් ලත් සීමොන් ය. (2) ජුදස් ස්කාරියොත් ය.
    (3) ලෙවී නම් ලත් මතෙව් ය. (4) යොහන් බෞතීස්ත ය.
09. ශුද්ධාත්ම දීමනා අපට ලැබී ඇත්තේ,
    A - එකිනෙකා දිරි ගැන්වීමටය. B - කිතුණු සභාව ශක්තිමත් කිරීමටය.
    C - පාපය අප තුළ රඳවා ගැනීමටය.
    ඉහත වරණ වලින් නිවැරදි පිළිතුර වන්නේ,
    (1) A හා B ය. (2) B හා C ය. (3) A හා C ය. (4) A,B හා C ය.

10. කිසිදු ප්‍රති උපකාරයක් බලාපොරොත්තු නොවී අන් අයගේ අවශ්‍යතාවන් සැපරීමට ඉදිරිපත් වීම.

(1) සාමය යි. (2) ඉවසීම යි. (3) ප්‍රේමය යි. (4) ප්‍රීතිය යි.

11. ඉවිලින් කානි විසින් අනාථ දරුවන් සඳහා .............. ද වැඩිහිටියන් සඳහා .............. පිහිටුවීය.

ඉහත හිස්තැන් වලට උචිත වචන දෙක සඳහන් පිළිතුර වන්නේ,

(1) සන්ධ්‍යාව හා ප්‍රීතිනිවාසය යි. (2) ප්‍රීති නිවාසය හා සන්ධ්‍යාව යි.

(3) සන්ධ්‍යාව හා නංගි ගෙදර යි. (4) ප්‍රීති නිවාසය හා නංගි ගෙදර යි.

12. යහපත් සිතුවිලි ඇති කරගැනීමටත්, නිරවුල් මනසක් ඇති කරගැනීමටත්, නොගැලපෙන දෙයින් ඈත් වීමටත් අත්‍යවශ්‍ය වන්නේ,

(1) පරිත්‍යාගශීලීත්ව ය. (2) බුද්ධිය ය.

(3) කාය ශක්තිය ය. (4) යාච්ඤාව ය.

13. 'ගැළවීම අද මේ නිවසට පැමිණ ඇත.' මෙසේ ජේසුස් වහන්සේ පැවසුවේ,

(1) ලෙවී ගැන ය. (2) පව්කාර ස්ත්‍රිය ගැන ය.

(3) සකෙවුස් ගැන ය. (4) පේදුරු ගැන ය.

14. ක්‍රිස්තුස් වහන්සේගේ ශ්‍රාවකයන්ට සුවකළ නොහැකි වූ රෝගයා වූයේ,

(1) අංශභාග රෝගියා ය. (2) යායිරස්ගේ දියණිය යි.

(3) මහලේ රෝගී කාන්තාව ය. (4) මීමැස්මොර රෝගියා ය.

15. 'ස්වාමිනි, ඔබ කැමති සේක් නම් මා පවිත්‍ර කරන්න ඔබට පුළුවන.' යැයි පැවසූ රෝගියා වූයේ,

(1) ලාදුරු රෝගියා ය. (2) අංශභාග රෝගියා ය.

(3) ගොලු බිහිරි මිනිසා ය. (4) යායිරස්ගේ දියණි ය.

16. දිව්‍ය සත්ප්‍රසාදය පවත්වමින් සිටින විට වෙඩිපහරකට ලක් වී මරණයට පත් වූයේ,

(1) සේවක සාමුවෙල් සෙල්වරත්නම් ය. (2) මයිකල් රුද්‍රිගු පියතුමා ය.

(3) ඇන්ඩෘ කුමාරගේ රදගුරුතුමා ය. (4) සෝමසිරි කුමාරදාස පෙරේරා දේවගැතිතුමා ය.

17. පංච පුස්තකය පිළිවෙලින් දැක්වෙන වරණය වන්නේ,

(1) උත්පත්ති, ලෙවිකථාව, ගණන් කථාව, නික්මයාම, ද්විතීය නීති සංග්‍රහය යි.

(2) උත්පත්ති, නික්මයාම, ලෙවී ව්‍යවස්ථාව, ගණන් කථාව, ද්විතීය නීති සංග්‍රහය යි.

(3) උත්පත්ති, ගණන් කථාව, ද්විතීය නීති සංග්‍රහය, නික්මයාම, ලෙවී ව්‍යවස්ථාව යි.

(4) උත්පත්ති, නික්මයාම, ගණන් කථාව, ලෙවී ව්‍යවස්ථාව, ද්විතීය නීති සංග්‍රහය යි.

18. පුරාණ ගිවිසුමේ සඳහන් විනිශ්වයකාරියක් මෙන් ම ප්‍රබල කාන්තා චරිතයක් ලෙස සඳහන් වන්නේ,

(1) රූත් ය. (2) දෙබෝරා ය. (3) එස්තර් ය. (4) දීනා ය.

19. ඊශ්‍රායෙල් ජනතාවගේ අධ්‍යාත්මික ජීවිතය යථා තත්ත්වයට පත් කිරීමට උත්සාහ ගත්තේ,

(1) නෙහෙමියා ය. (2) රූත් ය. (3) එස්රා ය. (4) දෙබෝරා ය.

20. මව් කුස පිළිසිඳ ගැනීමටත් පෙර දිව්‍යසිවර සේවයට කැඳවනු ලැබුවේ,

(1) යෙසායා ය. (2) නෙහෙමියා ය. (3) එසකියෙල් ය. (4) ජෙරමියා ය.

(ල. 2x20 = 40)

- **පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න 5 කට පිළිතුරු සපයන්න.**
- **කෙටි පිළිතුරු සපයන්න.**

01. (i) පාරාවෝ රජතුමා වින්නඹුවන්ට දුන් අණ දෙකක් ලියන්න.

(ii) ශුද්ධාත්ම දීමනා 02 ක් ලියන්න.

(iii) ජේසුස් වහන්සේ වැඩියේ සාකෙවුස්ගේ නිවසට පමණක් නොව ඔහුගේ ජීවිතයට ම බව සනාථ වන ඔහුගේ ප්‍රකාශය ලියන්න.

(iv) රෝගීන් සුව කිරීමෙන් අනතුරුව කිසිවෙකුට නොකියන ලෙස ජේසුස් වහන්සේ පැවසුවේ ඇයි?

(v) 'ක්‍රිස්තව සේවා ආශ්‍රම්' මගින් සිදු වූ සේවා 02 ක් ලියන්න.

(vi) ආදි පිතෘවරු දෙදෙනෙකු නම් කරන්න.

(vii) ආබ්‍රහම් තුමාගේ කැඳවීම තුළින් ඔහුට ලැබුණු අභියෝග 02 ක් ලියන්න.

(viii) ජෙරමියා දුටු දර්ශන 02 ලියන්න. (ල. 2x8 = 16)

02. (i) ජේසුස් වහන්සේ මුල් ගෝලයන් කැඳවන ලද්දේ කොහේදීද? (ල. 02)

(ii) මුල් ගෝලයන් 03 ක් නම් කරන්න. (ල. 03)

(iii) කිතුණු දරුවෙකු වන ඔබට ද දේව කැඳවීමක් ලැබුණහොත් ඊට දක්වන ප්‍රතිචාර 03 ක් ලියන්න. (ල. 06)

03. (i) 'ජොහන්ගේ පුත්‍ර වූ සීමොන් ඔබ මට ප්‍රේම කරන්නෙහිද? යන ප්‍රකාශය තෙවරක් පේදුරුගෙන් විමසීමට හේතුව කුමක්ද? (ල. 02)

(ii) ජේසුස් වහන්සේ පේදුරුට පැවරූ කාර්යයන් ත්‍රිත්වය ලියා දක්වන්න. (ල. 03)

(iii) පේදුරුගේ ජීවිතයෙන් අපට ගෙනෙන පාඩම් 03 ක් ලියන්න. (ල. 06)

04. (i) ශු. බයිබලයේ මුල් පොත් පහ හඳුන්වන නම් 02 ක් ලියන්න. (ල. 02)

(ii) දස පනතේ මුල් පනත් 03 නම් කරන්න. (ල. 03)

(iii) එම පනත් තුන ආරක්ෂා කිරීමට කිතුණු දරුවෙකු ලෙස කළ හැකි දේවල් 03 ක් ලියන්න. (ල. 06)

05. (i) දෙමාපිය ඇදහිල්ල හා ජේසුස් වහන්සේගේ දරුවන් කෙරෙහි ඇති ආදරය හේතු කොට ගෙන සුවය ලැබූ රෝගී දරුවන් දෙදෙනෙක් ලියන්න. (ල. 02)

(ii) ඉන් එක් කථාවක් කෙටියෙන් ලියන්න. (ල. 03)

(iii) රෝගී තත්වයකට පත් ව සිටින ඔබේ මිතුරෙකු වෙනුවෙන් කළ හැකි ක්‍රියාවන් 03 ක් විස්තර කරන්න. (ල. 06)

06. (i) ජෙරමියා යන නමෙහි අර්ථය ලියන්න. (ල. 02)

(ii) දිවැසිවර කැඳවීමේ පොදු ලක්ෂණ 03 ක් ලියන්න. (ල. 03)

(iii) ජෙරමියා දිවැසිවරයා මෙන් යහපත් සමාජයක් ගොඩනැගීමට දායක වන කිතුණු දරුයෙකු ලෙස ඔබ අනුගමනය කරන ක්‍රියාමාර්ග 03 ක් ලියා විස්තර කරන්න. (ල. 06)

## පිළිතුරු පත්‍රය - I කොටස

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| 01. ( 1 ) | 02. ( 4 ) | 03. ( 2 ) | 04. ( 4 ) | 05. ( 2 ) | 06. ( 3 ) | 07. ( 3 ) | 08. ( 1 ) | 09. ( 1 ) | 10. ( 3 ) |
| 11. ( 2 ) | 12. ( 4 ) | 13. ( 3 ) | 14. ( 4 ) | 15. ( 1 ) | 16. ( 2 ) | 17. ( 2 ) | 18. ( 2 ) | 19. ( 3 ) | 20. ( 4 ) |

## II කොටස

01. (i) ♦ ඉශ්‍රායේල පිරිමි දරුවන් උපතේදී ම විනාශ කිරීමටය.
♦ හෙබ්‍රෙව්වරුන්ට උපදින සෑම පිරිමි දරුවෙක්ම නයිල් ගඟට විසිකිරීමට.

(ii) ♦ හාස්කම් කිරීමේ බලය ♦ දිවැස් වැකි කීමේ බලය ආදී ශුද්ධාත්ම දීමනා වලින් දෙකක් ලියා තිබීම.

(iii) "ස්වාමිනී මා සන්තක දෙයින් දෙකෙන් කොටසක් දිළිඳුන්ට දෙමි. යමෙකුගෙන් අයුතු ලෙස යමක් ගෙන තිබේ නම් ඔහුට සතර ගුණයක් ආපසු දෙමි."

(iv) උන්වහන්සේට හාස්කම් මගින් ජනතාව තමන් වෙතට හරවා ගැනීමට අවශ්‍ය නොවූ නිසා ය.

(v) දුප්පත් පිරිමි දරුවන්ට ආශ්‍රමයේ නැවතී සිට පාසල් යාමට අවස්ථාව සලසා දීම. එම දරුවන්ගේ වියහියදම් එතුමා විසින් දරනු ලැබීම ආදී පිළිතුරු දෙකක් ලියා ඇත්නම් ලකුණු ලබා දෙන්න.

(vi) ආබ්‍රහම්, ඊසාක්.

(vii) ♦ දරුවන් අහිමි යැයි කී බිරිඳකගෙන් ජාතියක් බිහි කිරීම.
♦ නොදන්නා දේශයකට පිටත්ව යෑම ආදී පිළිතුරු ලියා තිබීම.

(viii) ♦ කලින් පිබිදෙන කොට්ටම්බා ගසක් ♦ උතුරු දෙසින් මේ දෙසට කට ඇරී උතුරන සැළියක්. (ල. 2x8 = 16)

02. (i) ගෙනසෙරත් විල හෙවත් ගලීල මුහුද (ල. 02)

(ii) පේදුරු, අන්ද්‍රෑ, ජාකොබ්, ජොහන් (ල. 03)

(iii) ලියා ඇති පිළිතුරු සලකා බලා ලකුණු ලබා දෙන්න. (ල. 06)

03. (i) පේදුරු තුමා තුළ නොවෙනස් වන ගැඹුරු පූජා වීමේ ප්‍රේමයක් මුල් බැස ගෙන ඇද්දැයි තහවුරු කර ගැනීම. (ල. 02)

(ii) ♦ මාගේ බැටළු පැටවුන් පෝෂණය කරන්න. ♦ මාගේ බැටළුවන්ගේ එඬේරා වන්න. ♦ මාගේ බැටළුවන් පෝෂණය කරන්න. (ල. 03)

(iii) ලියා ඇති පිළිතුරු අනුව ලකුණු ලබා දෙන්න. (ල. 06)

04. (i) පංච පුස්කකය, ටෝරා (ල. 02)

(ii) ♦ මා හැර අන් දෙවි කෙනෙකු නුඹට නොසිටිය යුතුය. ♦ රූප වන්දනා නොකළ යුතුය. ♦ දෙවියන් වහන්සේගේ නාමය අගරු ලෙස භාවිත නොකරන්න. (ල. 03)

(iii) පෙළ පොතේ 88 වැනි පිටුවට අදාළව පිළිතුරු ලියා ඇත්නම් ලකුණු ලබා දෙන්න. (ල. 06)

05. (i) ♦ මීමැස්මොර රෝගී දරුවා ♦ යායිරස්ගේ දියණිය මළවුන්ගෙන් උත්ථාන කිරීම. (ල. 02)

(ii) ඉහත කතා දෙකින් එකක් ලියා ඇත්නම් ලකුණු ලබා දෙන්න. (ල. 03)

(iii) ලියා ඇති පිළිතුරු අනුව ලකුණු ලබා දෙන්න. (ල. 06)

06. (i) 'දෙවියන් විසින් ඔසවා ගනු ලැබීම.' (ල. 02)

(ii) කැඳවීම, තම නොහැකියාවන් ඉදිරිපත් කිරීම, සමිඳුන් විසින් ධෛර්යවත් කිරීම., සේවය සඳහා යොමු කිරීම. (ල. 03)

(iii) ලියා ඇති පිළිතුරු සලකා බලා ලකුණු ලබා දෙන්න. (ල. 06)